**16-12-2025** **උදෑසන මුරලි** **ඕම් ශාන්ති** **බාප්දාදා** **මධුබන්**

**සාරය:** සුමිහිරි දරුවනි, ඔබ ඉගෙනගෙන අන් අයට ඉගැන්විය යුතුයි. මෙහිදී ආශිර්වාද පිළිබඳ ප්‍රශ්නයක් නැත. සෑම කෙනෙකුටම පරම පියාව සිහිපත් කරන්නට කියා පවසන්න, එවිට ඔවුන්ගේ සියලුම දුක් ඉවත් වී යයි.

**ප්‍රශ්නය:** මනුෂ්‍යයින්ට තිබෙන සිත් පීඩා මොනවාද? ඔය දරුවන්ට කිසිම සිත් පීඩාවක් නැත. ඒ ඇයි?

**පිළිතුර:** මෙකල මනුෂ්‍යයින්ට සිත් පීඩා හැර වෙනත් දෙයක් නැත. ඔවුන්ගේ දරුවා අසනීප වූ විට ඔවුන් සිත් පීඩාවට පත් වෙයි. දරුවා මිය ගියොත් ඔවුන් සිත් පීඩාවට පත් වෙයි. කෙනෙකුට දරුවෙක් නොමැති විට ඔහු සිත් පීඩාවට පත්වෙයි. කෙනෙක් බෝහෝ ධාන්‍ය ගබඩා කර තබා, පොලීසියෙන් හෝ දේශීය ආදායමේ මිනිසුන් පරීක්ෂා කිරීමට පැමිණි විට, ඔහු සිත් පීඩාවට පත්වෙයි. මෙය අපිරිසිඳු ලෝකයකි; දුක් ගෙන දෙන ලෝකයකි. ඔබට බාබා, සත්ගුරුව හමු වී ඇති බැවින්, ඔය දරුවන්ව සිත් පීඩාවට පත් කිරීමට කිසි දෙයක් නැත. මෙසේ කියැවෙයි සමිඳුන්ව, සත්ගුරුව, හමුවීමෙන් ඔබ සියලු සිත් පීඩාවන්ගෙන් මිදී ඇත. ඔබ දැන් සිත් පීඩාවන්ගෙන් නිදහස් ලෝකයකට යනවා.

**ගීතය:** සෙසෙනෙහසේ මහා සයුර ඔබයි; අප එක් බිඳුවකට පිපාසිත වන්නෙමු!

ඕම් ශාන්ති. මිහිරිතම දරුවනි, ඔබට ගීය ඇසුණා. එහි අරුතද ඔබට වැටහෙයි; අපද මාස්ටර් සෙනෙහසේ මහා සාගර විය යුතුයි. සියලුම ජීවාත්ම, සහෝදරයන්ය. එබැවින් පරමාත්ම පියා ඔය සහෝදරයන්ට පවසන්නේ මා සෙනෙහසේ මහා සයුර වන්නා සේම, ඔබත් බොහෝ සෙනෙහසින් යුතුව අන්තර් සබඳතා පැවැත්විය යුතුයි. දේවතාවන් තුළ බොහෝ සෙනෙහස තිබේ, එබැවින් මිනිසුන් ඔවුන්ට බොහෝ ආදරය කර, ඔවුන්ට බෝග් පුදයි. ඔබ දැන් පිවිතුරු විය යුතුයි මෙය මහ ලොකු දෙයක් නොවෙයි. මෙය ඉතා අපිරිසිඳු ලෝකයකි. සෑම දෙයක් ගැනම සිත් පීඩා ඇතිවෙයි. දුක්පිට දුක්, හැර වෙනත් දෙයක් නොමැත. මෙයට දුක් දේශය යැයි කියයි. පොලීසිය හෝ ආදයම් බදු අය පැමිණි විට, ඔවුන් බොහෝ සේ මිනිසුන්ට වද දෙයි, ඒ ගැන අහන්නවත් එපා! කෙනෙක් බොහෝ ධාන්‍ය ගබඩා කර තබා, පොලීසිය පැමිණි විට ඔහු සුදුමැලි වෙයි. මෙය බොහෝ අපිරිසිඳු ලෝකයකි එය අපායයි. ඔවුන් දිව්‍ය ලෝකය සිහි කරයි. චක්‍රය අඛණ්ඩව බ්‍රමණය වෙයි අපායට පසු දෙව්ලොව සහ දෙව්ලොවට පසුව අපාය. ඔබව දෙව්ලොව වැසියන් බවට පත් කරවීමට, පරම පියා දැන් පැමිණ ඇති බව ඔය දරුවන් දන්නවා. ඔහු ඔබව අපායේ වැසියන්ගෙන් දෙව්ලොව වැසියන් බවට පරිවර්ථනය කරයි. එහි රාවන නොමැති බැවින් දුර්ගුණ නොපවතී. එය සම්පූර්ණයෙන්ම දුර්ගුණ වලින් තොර ශිව දේවාලයයි (ශිවාලය). මෙය ගණිකා මඩමයි. මේ ලෝකයේ තිබෙන්නේ දුකද, නැත්නම් සැපද කියා, සෑම කෙනෙකුටම කොහොම දැනෙයිද කියා ටිකක් ඉඳ බලන්න. ඉතා කුඩා භූමිකම්පාවක් ඇති වන විට, මිනිසුන්ගේ තත්ත්වය කුමක්ද කියා බලන්න. ස්වර්ණමය යුගයේදී කිසිම දෙයක් ගැන සුළු සිත් පීඩාවක්වත් නැත. මෙහි බොහෝ සිත් පීඩා ඇත. ඔවුන්ගේ දරුවන් අසනීප වූ විට, ඔවුන් සිත් පීඩාවට පත්වෙයි දරුවා මිය ගිය විට, ඔවුන් සිත් පීඩාවට පත්වෙයි. සිත් පීඩාම හැර වෙනත් දෙයක් නැත. ඔබව සියලු සිත් පීඩාවන්ගෙන් ඔබ්බට රැගෙන යන්නේ ස්වාමියා පමණයි. සියල්ලන්ගේම ස්වාමියා වන්නේ ඒකායන කෙනා පමණයි. ඔබ අසුන්ගෙන සිටින්නේ ශිව බාබා ඉදිරියේය. මෙම බ්‍රහ්මා, ගුරු කෙනෙක් නොවෙයි. මෙම කෙනා භාග්‍ය රථයයි. පරම පියා අපට භාග්‍ය රථය මඟින් උගන්වයි. ඔහු ඥානයේ මහා සාගරයයි. ඔබටද සියලුම ඥානය ලැබී තිබේ. ඔබ නොදන්නා කිසිම දේවතාවක් නැත. සත්‍යය යනු කුමක්ද බොරුව යනු කුමක්ද කියා ඔබ හඳුනාගෙන ඇත. ලෝකයේ කිසි කෙනෙක් මෙය නොදනී. එය සත්‍යයේ දේශය වූ අතර එය දැන් මුසාවේ දේශයයි. කවුරු කවදා සත්‍ය දේශය ස්ථාපිත කළාද කියා, කිසිවෙක් නොදනී. මෙය අවිද්‍යාවේ අන්ධකාර රාත්‍රියයි. පරම පියා පැමිණ ඔබට ආලෝකය ලබා දෙයි. මිනිසුන් ගායනා කරන්නේ ඔබගේ ක්‍රම සහ විදි දන්නේ ඔබ පමණයි. උසස්ම උසස් කෙනා වන්නේ ඔහුම පමණක් වන අතර අන් සියල්ලම නිර්මාණයයි. ඔහු නිර්මාපකයාය, අසීමිත පියාය. දරුවන් දෙදෙනෙක් හෝ සතර දෙනෙක් සිටින අය, සීමිත පියවරුන්ය. ඔවුන්ට එකදු දරුවෙක්වත් නොමැති විට, ඔවුන් සිත් පීඩාවට පත්වෙයි. එහි එවැනි කිසිවක් නැත. එහි ඔබට දීර්ඝ ආයු කාලයක් තිබෙන අතර ඔබ බොහෝ සේ ධනවත්ය. ඔබ ආශිර්වාද නොදෙයි මෙය ඉගෙනුමකි. ඔබ ගුරුවරුන්ය. ඔබ ඔවුන්ට සරළව පවසන්නේ ශිව බාබාව සිහිකරන්න, එවිට ඔබගේ පාපයන් දුරු වී යයි.

මෙයත් ඉගෙනුමක්. මෙය හැඳින්වෙන්නේ පහසු යෝගාව සහ සිහිකිරීම කියාය. ජීවාත්මය අවිනාශී වන අතර, සිරුර විනාශ වෙයි. පරම පියා පවසන්නේ මාද අවිනාශීය. පැමිණ, අපවිත්‍ර අයව පිවිතුරු කරන්නට කියා ඔබ මට කන්නලව් කරයි. මෙසේ පවසන්නේ ජීවාත්මයයි. මෙසේ කියයි අපවිත්‍ර ආත්මය, මහාආත්මය. පාරිශුද්ධත්වය ඇති විට, සාමය සහ සතුටද තිබේ. වඩාත්ම පූජණීය වූ දේවස්ථානය මෙයයි. පාපයේ ගැලෙන අයට මෙහි පැමිණීමට අවසර නැත. සුරංගනාවක් රහසිගතව එතැනට මනුෂ්‍යයෙක් රැගෙන පැමිණි, ඉන්ද්‍රාගේ අධිකරණයේ කතාපුවත තිබේ. ඇය හසු වූ විට, ඇයට සාපයක් වැදී, ගලක් බවට පත්විය. මෙහිදී සාපයක් වැදීම පිළිබඳ ප්‍රශ්නයක් නැත. මෙහි තිබෙන්නේ ඥාන වර්ෂාවයි. මෙම පූජණීය ස්ථානයට කිසිම අපවිත්‍ර කෙනෙකුට පැමිණිය නොහැක. මෙහි විශාල ශාලාවක් ඇතිවන කාලයක් පැමිණෙයි. පූජණීයම වූ පූජණීය ස්ථානය මෙයයි. ඔබද පූජණීය බවට පත්වනවා. පාපය නොමැතිව ලෝකය පවතින්නේ කෙසේද කියා මිනිසුන් විමසයි. මෙය වන්නේ කෙසේද? සෑම දෙයක් පිළිබඳව, ඔවුන්ගේම දැනුම ඔවුන්ට ඇත. ඔවුන් දේවතා පිළිම ඉදිරියට ගොස් මෙසේ කියයි ඔබ සියලු ගුණධර්ම වලින් පිරිපුන් අතර, අප පාපතරයන්ය. වඩාත්ම පූජණීය වන්නේ දිව්‍ය ලෝකයයි. උපත් 84 ක් ගැනීමෙන් පසුව, වඩාත්ම පූජණීය වන්නේ ඔවුන්ය. එය පිවිතුරු ලෝකය වන අතර, අපවිත්‍ර ලෝකය මෙයයි. ඔවුන්ට දරුවෙක් ලැබුණු විට, ඔවුන් විශාල සතුටකින් එය සමරන නමුත් දරුවා අසනීප වූ විට ඔවුන්ගේ මුහුණු සුදුමැලි වෙයි. ඔහු මිය යන්නේ නම්, ඔවුන් මුළුමනින්ම උමතු වෙයි. ඇතැමුන්ට එසේ වෙයි. සමහරුන් එවැනි අයව බාබා වෙතට පවා රැගෙන විත් ඔහුට මෙසේ කියයි බාබා, ඇගේ දරුවා මිය ගිය නිසා මෙම කෙනා උමතු වී ඇත. මෙය දුක් ලෝකයයි. පරම පියා දැන් මෙහි සිටින්නේ ඔබව සතුටු ලෝකය වෙත රැගෙන යාමටයි. එබැවින් ඔබ ශ්‍රීමත් අනුගමනය කළ යුතුයි. ඔබට ඉතාමත්ම හොඳ ගුණධර්මද තිබිය යුතුයි. යමක් කරන අයට එහි ප්‍රතිලාභය ලැබෙයි. දිව්‍යමය චරිතයක්ද අවශ්‍යයි. පාසැල්වල, ඔවුන් සෑම කෙනෙකුගේම චරිතය, වාර්තාවක සටහන් කරගනී. ඇතැම් අය පිටත ඉබාගාතේ යයි. ඔවුන් තම දෙමාපියන්ට බොහෝ ප්‍රශ්න ඇතිකරයි. පරම පියා දැන් ඔබව සාමයේ දේශයට සහ සතුටෙහි දේශයට රැගෙන යාමට නියමිතයි. එයට නිහැඬියාවේ කුළුන යැයි කියයි එය නිහැඬියාවේ ගිරි ශිඛරයයි. ජීවාත්ම, වාසය කරන ස්ථානය, නිහැඬියාවේ කුළුනයි. සූක්ෂම දේශයේ තිබෙන්නේ 'චලනයයි.' ඔබට එහි දර්ශන නිකමට ලැබෙන්නේ එහි කිසිවක් නොමැති නිසාය. ස්වර්ණමය යුගයේදී ඔබ මහළු වියට පත් වූ විට විශාල සතුටකින් ඔබගේ පැරණි සම අත්හරින ආකාරයේ දර්ශනද ඇතැම් දරුවන්ට ලැබී තිබේ. මෙය උපත් 84 ක් පැරණි, මහළු සමකි. පරම පියා පවසන්නේ ඔබ පිවිතුරුව සිටි අතර, දැන් අපවිත්‍ර වී තිබේ. පරම පියා දැන් පැමිණ ඇත්තේ ඔබව පිවිතුරු කිරීමටයි. ඔබ මට අඬගැසුවා. ජීවමාන ජීවාත්මයි, අපවිත්‍ර වී තිබෙන්නේ, ඉන්පසුව ඔවුන් නැවතත් පිවිතුරු වෙයි. ඔබ අයත් වූයේ දේවතා රජ පෙළපතටයි. ඔබ දැන් අයත් වන්නේ රකුසු පෙළපතටයි. රකුසු පෙළපත සහ දේවමය, එනම් දේවතා රජ පෙළපත අතර විශාල වෙනස්කම් තිබේ. මෙය ඔබගේ බ්‍රහ්මණ වංශයයි. රජ පෙළපතක් යනු රාජධානියක් ඇති තැනකි. මෙහි රාජධානියක් නැත. පාණ්ඩවයන්ගේ සහ කෞරවයන්ගේ රාජධානි ගැන ගීතාවේ සඳහන් කර ඇති නමුත්, ඒවා සැබවින් නොපවතී. ඔබ ආධ්‍යාත්මික දරුවන්ය. පරම පියා පවසන්නේ සුමිහිරි දරුවනි, බොහෝ සේ මිහිරි වන්න. සෙනෙහසේ සාගර වන්න. ඔබ සෙනෙහසේ සයුරු නොවන්නේ, ශරීර අවධානය නිසාය. බොහෝ දඬුවම් විඳින්නට සිදුවන්නේ මේ නිසාය. ඒ වෙලාවේදී, දඬුවම් ලැබ, ඉන්පසුව කුඩා චපාති කැබැල්ලක් ලැබෙන්නාක් මෙන් වෙයි. ඔබ දිව්‍ය ලෝකයට යයි, නමුත් බොහෝ දඬුවම් අත්විඳීමෙන් පසුවයි. දඬුවම් ලබා දෙන්නේ කෙසේද කියා, ඔබට දර්ශන වලින් පෙන්වා ඇත. බාබා පහදා දෙන්නේ බොහෝ සෙනෙහසින් සෑම කෙනෙක් සමගම සම්බන්ධ වන්න එසේ නැත්නම් කෝපය මතු විය හැක. ඔබව අපායෙන් මුදවා, දිව්‍ය ලෝකයට රැගෙන යන පරම පියාව හමුවීම ගැන කෘතඥපූර්වක වන්න. දඬුවම් ලැබීම ඉතා නරකයි. ස්වර්ණමය යුගයේ තිබෙන්නේ සෙනෙහසේ රාජධානිය බව ඔබ දන්නවා එහි ඇත්තේ සෙනෙහසම පමණයි. මෙහි, සුළු දේවල් නිසා කෙනෙකුගේ මුහුණ වෙනස් වෙයි. පරම පියා පවසන්නේ මා අපවිත්‍ර ලෝකයට පැමිණ සිටියි. අපවිත්‍ර ලෝකයට පැමිණෙන්නට මට ආරාධනාවක් ලබා දී ඇත. එවිට පරම පියා, සෑම කෙනෙකුටම අමෘතය පානය කිරීමට ආරාධනා කරයි. අමෘතය සහ වස ගැන පොතක් මුද්‍රණය කර තිබේ. එම පොතේ කතුවරයා ඉතා සුප්‍රසිද්ධ වන අතර ඔහු තෑග්ගක් හිමිකර ගෙන තිබේ. ඔහු ලියා ඇති දේ ඔබ දැකිය යුතුයි. පරම පියා පවසන්නේ මා ඔබට පානය කිරීමට ඥාන අමෘතය ලබා දෙමි. එසේ නම් ඔබ වස පානය කරන්නේ ඇයි? රක්ෂා බන්දන උත්සවය, මෙම කාලයේ සිහිවටනයකි. පරමාත්ම පියා, සෑම කෙනෙකුටම මෙම අවසන් උපතේදී පිවිතුරු වන බවට, පොරොන්දුවක් වන ලෙස පවසයි. ඔබ පිවිතුරු වී, යෝගාවේ සිටියොත් ඔබගේ පාපයන් කැපී යයි. ඔබගේ හදවතින් ඔබ විමසිය යුතුයි මා සිහිපත් කිරීමේ සිටිනවාද නැද්ද? ඔවුන්ගේ කුඩා දරුවන් සිහි වන විට, මිනිසුන් බොහෝ සතුටට පත්වෙයි. සැමියා සහ බිරිඳ

එකිනෙකා සිහි කර, බොහෝ සතුටු වෙයි. අශාරීරික දෙවියන්ගේ වදන් තිබේ. ඔහු කවරෙක්ද? පරම පියා පවසන්නේ ඔහුගේ 84 වන උපතින් පසුව, මා නැවත වරක් මොහුව දිව්‍ය ලෝකයේ අධිපතියෙක් බවට පත්කරවමි. වෘක්ෂය තවමත් කුඩාය. මායාගේ කුණාටු බොහෝ පැමිණෙයි. මේවා බොහෝ සේ අදෘෂ්‍යමාන කාරණාය. පරම පියා පවසන්නේ දරුවනි, සිහිපත් කිරීමේ වන්දනාවේ සිට, පාරිශුද්ධත්වයට පත්වන්න. මුළු රාජධානියම ස්ථාපිත විය යුත්තේ මෙහිදීය. ගීතාවේ ඔවුන් යුද්ධයක් පෙන්වා ඇති අතර ඉන්පසුව පාණ්ඩවයන් කඳු මුදුනේ දිය වී යන ආකාරය පෙන්වා තිබේ. කෙසේවෙතත්, ඉන් ප්‍රතිඵලයක් නැත. ඔබ දැන් ලෝකයේ මුල, මැද සහ අවසානය දන්නවා. පරම පියා, ඥානයේ මහා සයුරයි. ඔහු පරමාත්ම ජීවයයි. ජීවාත්මයක ස්වරූපය කුමක් වැනිද කියා කිසිම කෙනෙක් නොදනී. මෙම කරුණ ඔබගේ බුද්ධිය තුළ තිබේ. ඔබගෙන් ඇතමෙක් මෙය නිවැරදිව තේරුම් නොගන්නා අතර එවිට ඔවුන් විමසන්නේ තිතක් සිහිපත් කරන්නේ කෙසේද? ඔවුන්ට කිසිම දෙයක් නොවැටහෙයි. කෙසේනමුත්, පරම පියා පවසන්නේ ඔවුන් ටිකක් ඇසුවත්, මෙම ඥානය කිසිදා විනාශ වන්නේ නැත. ඇතැම් අය ඥාන මාවතට පැමිණ, ඉන්පසුව පිටවී යයි, නමුත් ඔවුන් ටිකක් හෝ අසා ඇති බැවින්, ඔවුන් අනිවාර්යෙන්ම දිව්‍ය ලෝකයට යයි. බොහෝ සේ සවන් දී එමෙන්ම එය ධාරණය කරගන්නා අය, රාජධානියේ කොටසක් වෙයි. ටිකකට පමණක් සවන් දෙන අය, පුරවැසියන්ගෙන් කොටසක් වෙයි. රාජධානියක, රජ, රැජිණ සහ පුරවැසියන් සිටියි. එහි උපදේශකවරුන් නැත. මෙහි පාපයේ ගැලෙන රජවරුන්ට උපදේශකයන් පත් කිරීමට අවශ්‍යයි. පරම පියා ඔබගේ බුද්ධිය බොහෝ පුළුල් මෙන්ම අසීමිත කරවයි. එහි උපදේශකවරුන් පත් කිරීමට අවශ්‍යතාවයක් නැත. සිංහයා සහ බැටළුවා එකට වතුර බොයි. එබැවින් පරම පියා විස්තර කරන්නේ ඔබ ලුණු වතුර මෙන් නොවිය යුතුයි කිරි පැනි මෙන් වන්න. කිරි සහ පැනි යන දෙකම හොඳ දේවල්ය. කිසිම කෙනෙක් සමග කිසි ගැටුමක් ඇති කර නොගන්න. මෙහි මිනිසුන් බොහෝ සේ සණ්ඩු සරුවල් කරයි. මෙය අපායේ අන්ත අගාධයයි. අපායේ ඔවුන්ගේ හුස්ම දිගින් දිගටම සිරවෙයි. පරම පියා පැමිණ ඇත්තේ ඔබව ඉන් මුදවා ගැනීමටයි. මුදවා ගන්නා අතර ඔබ ඇතැම් විට සිර ගතවෙයි. ඇතැම් අය ගොස් අන් අය මුදවා ගැනීමට උත්සාහ දරයි, නමුත් ඔවුන්ද එහි සිරවෙයි. ආරම්භයේදී බොහෝ දෙනෙක් මායා වන කිඹුලා විසින් අල්ලා ගනු ලැබුවා ඇය ඔවුන්ව මුළුමනින්ම ගිල දැමුවා ඔවුන්ගේ සළකුණක්වත් ඉතිරි වූයේ නැත. සමහරු ඉන්පසුවත් ඥානයේ සළකුණු ඉතිරි කරගන්නවා, එබැවින් ඔවුන් නැවත ආපසු පැමිණෙයි. සමහරු මුළුමනින්ම අවසන් වෙයි. මෙහි සෑම දෙයක්ම ප්‍රායෝගික අන්දමකින් සිදුවෙයි. ඔබ ඉතිහාසය ගැන ඇසුවොත් විශ්මයට පත්වෙයි. මෙවැනි ගීතයකි ඔබ අපට ආදරය කළත්, ඔබ අපව ප්‍රතික්ෂේප කළත්, අප කිසිදා ඔබගේ දොරකඩ හැර නොයන්නෙමු. බාබා එවන් දේවල් ඔහුගේ මුවින් කිසිදා පවසන්නේ නැත. ඔහු බොහෝ සෙනෙහසින් ඔබට උගන්වයි. ඔබගේ අරමුණ සහ ඉලක්කය ඔබ ඉදිරියේ ඇත. උසස්ම උසස් පියා, ඔබව එය (විෂ්ණු) බවට පත්කරවනවා. එම විෂ්ණුම ඉන්පසුව බ්‍රහ්මා බවට පත්වෙයි. ඔහු තත්පරයකින් විමුක්තිය ලබාගත් අතර ඉන්පසුව උපත් 84 කට පසුව, එය බවට පත්විය. එයම ඔබටද බලපායි. ඔබ විසින් එම ඡායාරූපද ගන්නා ලදි. ඔබ බ්‍රහ්මණයින්, බ්‍රහ්මාගේ දරුවන්ය. ඔබට මෙකල කිරුළු නැත ඔබට අනාගතයේදී ඒවා ලැබෙයි. මේ නිසයි ඔබගේ එම පිංතූරය තවමත් තිබෙන්නේ. පරම පියා පැමිණ ඔය දරුවන්ව ද්විත්ව කිරුළු පළන් අය බවට පත් කරවයි. පෙර ඔබට සැබවින්ම සියලුම අවගුණ තිබුණු බව, ඔබට හැඟෙයි. (නාරදගේ නිදසුන) මුල්ම බැතිමතුන් ඔබලාය. පරම පියා දැන් ඔබව බොහෝ ශ්‍රේෂ්ඨත්වයට පත් කරවයි. ඔහු ඔබව අපවිත්‍ර බවින් සම්පූර්ණයෙන්ම පිවිතුරු කරයි. පරමාත්ම පියා ඔබගෙන් කිසි දෙයක් නොගනී. ශිව බාබා ඔබගෙන් කුමක් ගනීද? ඔබ ශිව බාබාගේ බන්දාරියට (සම්මාදම් පෙට්ටිය) යමක් දමයි. මම භාරකරුවෙක් ඔබගේ සියලු ගනුදෙනු වල ගිණුම් සිදු කරන්නේ ශිව බාබා සමඟයි. මා ඉගෙනගෙන උගන්වන්නෙමි. තමා සතු සියල්ල දුන් කෙනෙක්, වෙනත් අයගෙන් කුමක් ගනීද? කිසි දේකට කිසිම බැඳීමක් ඉතිරිව නැත. මිනිසුන් ගායනා කරන්නේ අහවල් කෙනා දිව්‍ය ලෝකයට ගියා. එසේ නම් ඔබ අපායේ ආහාර පාන වලින් ඔහුට කවන්නේ ඇයි? එය අවිද්‍යාවයි. ඔබ සෑම කෙනෙක්ම සිටින්නේ අපායේ නම්, පුනර්භවයක් ගන්නේද අපායේය. ඔබ දැන් අමරණීය දේශයට යනවා. මෙය කරණම් ගැසීමේ ක්‍රීඩාවයි. බ්‍රහ්මණයින් වන ඔබ මුදුන් ගැටය වන අතර, ඉන්පසුව ඔබ දේවතාවන්ද පසුව ක්ෂත්‍රියන්ද වෙයි. එබැවින් පරම පියා විස්තර කරන්නේ බොහෝ සේ මිහිරි වන්න. ඔබ තම චරිතය නිවැරදි කර නොගන්නේ නම්, එය ඔබගේ භාග්‍යය බව කියනු ලබයි. ඔබ තමන්ට පාඩුවක් සිදු කරගනී. ඔබ තමන්ව කිසිසේත් නිවැරදි කර නොගන්නේ නම්, පරමාත්ම දෙවියන් කුමන උත්සාහයක් දරන්නද? පරමාත්ම පියා පවසන්නේ මා කතා කරන්නේ ජීවාත්මයන්ටයි. ජීවාත්මය, කන් දෙකෙන් සවන් දෙයි. මෙම ඥානය පවසන්නේ අසීමිත පියාය. ඔහු ඔබව සාමාන්‍ය මනුෂ්‍යයින්ගෙන් දේවතාවන් බවට පරිවර්ථනය කරවයි. උත්තරීතර මාර්ගෝපදේශකයා ඔබට මාර්ගය පෙන්වීමට මෙතැන අසුන්ගෙන සිටිනවා.

ශ්‍රීමත් පවසන්නේ පිවිතුරු වී, මා සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් පිළිස්සී යනු ඇත. ඔබ සතෝප්‍රධාන් වීය. ඉන්පසුව ඔබ උපත් 84 ක් ගත්තේය. පරම පියා මෙම කෙනාට විස්තර කර දෙන්නේ ඔබ සතෝප්‍රධාන්ව සිටි අතර, දැන් තමෝප්‍රධාන් වී ඇත. දැන් නැවත වරක් මා සිහි කරන්න. මෙයට යෝගාවේ ගින්න යැයි කියයි. ඔබට මෙම ඥානය තිබෙන්නේ දැන්ය. ස්වර්ණමය යුගයේදී කිසි කෙනෙක් මා සිහි නොකරයි. මා සිහිපත් කරන්න, එවිට ඔබගේ පාපයන් කැපී යයි, කියා මා ඔබට පවසන්නේ මෙකල පමණයි. වෙනත් මඟක් නැත. මෙය පාසැලක්. එයට විශ්ව විද්‍යාලයක් යැයි කියයි. නිර්මාපකයා සහ නිර්මාණයේ මුල, මැද සහ අවසානය පිළිබඳ ඥානය වෙනත් කිසිවෙකුට නැත. ශිව බාබා පවසන්නේ: ලක්ෂ්මී සහ නාරායනටවත් මෙම ඥානය නොමැත. එහි තිබෙන්නේ එහි තිළිණයයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වූණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. ඔබ සෙනෙහසේ රාජධානියට යා යුතුයි. එබැවින් එකිනෙකා සමග කිරි පැණි මෙන් වන්න. කිසිම විටෙක ලුණු වතුර මෙන් නොවන්න හෝ එකිනෙකා සමග ගැටුම් ඇති කර නොගන්න. ඔබ තමන්ව නිවැරදි කරගත යුතුයි.
2. ශරීර අවධානය අත්හැර, මාස්ටර් සෙනෙහසේ සාගර බවට පත් වන්න. ඔබගේ චරිතය, දිව්‍යමය කරගන්න. එකිනෙකා සමග මහත් මිහිරි බවකින් කටයුතු කරන්න.

**වරදානය:** ඔබ ඔබේ මනසින් මහා පරිත්‍යාගශීලියෙකු වී සියලු ආත්මයන්ට ඔබේ මනසේ නිදහසින් සාමයේ පරිත්‍යාගය ලබා දෙත්වා.
සමහර මව්වරුන් භෞතිකව බන්ධනයක සිටියත්, ඔවුන් නිරන්තරයෙන් ඔවුන්ගේ මනසින් නිදහස් වන අතර, එමනිසා, ඔවුන්ගේ ආකල්ප සහ පිරිසිදු සිතිවිලි සමඟ ලෝකයේ වාතාවරණය පරිවර්තනය කිරීමට ඔවුන්ට සේවය කළ හැකිය. වර්තමානයේ, ලෝකයේ සෑම කෙනෙකුටම මනසේ සාමය අවශ්‍යයි. මනසින් නිදහස් ආත්මයන්ට, මනසින් සාමයේ කම්පන පතුරුවා හැරිය හැකිය. ඔබ පරමාත්ම පියාගේ, සාමයේ සාගරයේ සිහිපත් කිරීමේ සිටීමෙන් සාමයේ කිරණ ඉබේටම සෑම තැනකම පැතිර යනු ඇත. මේ ආකාරයෙන් සාමය පරිත්‍යාග කරන අය ඔවුන්ගේ මනසින් මහා පරිත්‍යාගශීලීන් වේ.

**පාඨය:** ඔබ සෙනෙහසේ ස්වරූපය පිළිබඳ ඔබේ අත්දැකීම් පවසන නමුත්, දැන් බලයේ ස්වරූපය පිළිබඳ ඔබේ අත්දැකීම් පවසන්න.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සම්පූර්ණ හා කර්මතීත් වීමේ ගැඹුරු සැලකිල්ල ඇති කරගන්න.**

සෑම බ්‍රහ්මින්වරයෙකුම බ්‍රහ්ම බාබා මෙන් ජීවමාන ප්‍රතිරූපයක් බවට පත්විය යුතුය. ප්‍රදීපාගාරයක සහ බලාගාරයක අවධියේ ප්‍රදර්ශන භාණ්ඩයක් වන්න. චින්තන බලය සහ නිශ්ශබ්දතාවය පිළිබඳ දේශනයක් සූදානම් කර ඔබේ කර්මතීත් අවධියේදී ආශිර්වාද ලබා දෙන ප්‍රතිරූපයක් වීමේ චරිත කොටස රඟපාන්න, එවිට ඔබ පරිපූර්ණත්වයට සමීප වනු ඇත. එවිට, තත්පරයකටත් අඩු කාලයකින්, ඔබට කාර්යයක් ඉටු කිරීමට සිදුවන ඕනෑම තැනක රැහැන් රහිතව උපදෙස් ලබා දීමට ඔබට හැකි වනු ඇත. ඔබේ කර්මතීත් අවධියේ පදනම මත, ඔබට සිතිවිල්ලක් ඇති වන අතර එය තත්පරයකින් ඔබට අවශ්‍ය ඕනෑම තැනකට ළඟා වනු ඇත.